// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2375/11 – 2024 මාර්තු මස 11 වැනි සඳුදා – 2024.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2023 අංක 28 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/5/2018/HA/105.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DSM/YTT/LAND/5/50.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 01 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, යටවත්ත.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක E339B, වාලවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වාලවෙල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මා 1844 ඉඩම් විස්තර ලැයිස්තුවෙහි පිටු අංකය 1 හා 2021.07.13 දිනැති අවසාන ගම් පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

1. **කැබලි අංක 1 – වාලවෙල කුඹුර හෙවත් මාලිගාවේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0607**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ ටී. ඩබ්ලිව්. ඒ. බදලතා හිමිකම් කියන මොරගස්පිටිය වත්ත; නැගෙනහිරට: ටී. ඩබ්ලිව්. ඒ. බදලතා හිමිකම් කියන මොරගස්පිටිය වත්ත සහ ජයතිස්ස එරමුදුගොල්ල හිමිකම් කියන පොල්වත්ත; දකුණට: ඇළ සහ ජයතිස්ස එරමුදුගොල්ල හිමිකම් කියන මාලිගාවේ කුඹුර; බටහිරට: ජයතිස්ස එරමුදුගොල්ල හිමිකම් කියන මාලිගාවේ කුඹුර සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව).

EOG 03 – 0095

1A – G 041574 – 19 (2024/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 (ආ) අතුරු විධාන ආඥාව

**2023 අංක 165 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/18/2021/WS/161.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/TUM/4/1/1/12.

අංක 2350/18 හා 2023.09.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද 2023 අංක 165 දරන ලද ආඥාවේ සඳහන් පරවශතාවේ විස්තරයෙහි "මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ගල්ලෙනවත්ත සේවා ජලාශය දක්වා සම්ප්‍රේෂණ නළ එළීම හා එහි සිට බෙදා හැරීමේ නළ එළීම සඳහා ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීම" ලෙස වැරදීමකින් මුද්‍රණය වී ඇත. එබැවින් එය "මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ගල්ලෙනවත්ත සේවා ජලාශය දක්වා සම්ප්‍රේෂණ නළ එළීම හා එහි සිට බෙදා හැරීමේ නළ එළීම සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීම" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 01 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03 – 0098

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.